ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

# ඔබගේ අනන්‍ය වූ හඳුනාගැනීමේ අංක බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මූදල් සමාගම් වෙත දැනුම් දෙන ලෙස කරනු ලබන නිවේදනයයි.

බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම්වල දැනට ගිණුම් පවත්වාගෙන යනු ලබන තැන්පත්කරුවන්ගේ අනන්‍ය වූ හඳුනාගැනීමේ අංක 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනත යටතේ නිකුත් කර ඇති මෙහෙයුම් උපදෙස් ප්‍රකාරව, අනිවාර්යයෙන් ම සටහන් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලබා දී ඇති කාලය 2024.12.31 දිනෙන් අවසන් වේ.

ඒ අනුව පහත වගුවේ දක්වා ඇති පරිදි තවමත් අවශ්‍ය හඳුනාගැනීමේ ලියකියවිලි (මූලික වශයෙන් පුද්ගලයන් සඳහා වන ජාතික හැඳුනුම්පත) ලබා ගෙන නොමැති හෝ අදාළ ලියාපදිංචි කිරීමේ ආයතනයේ ලියාපදිංචිය සම්පූර්ණ කර නොමැති සියලුම පුද්ගලයින්ට සහ ආයතනවලට, 2024.12.31 දිනට පෙර ඔවුන්ගේ හඳුනාගැනීමේ ලියකියවිලි හෝ ලියාපදිංචි කිරීමේ ලියකියවිලි කඩිනමින් ලබා ගන්නා ලෙසත්, අදාළ බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම් වෙත ඔවුන්ගේ අනන්‍ය වූ හඳුනාගැනීමේ අංක ලබා දෙන ලෙසත් දැනුම් දෙනු ලැබේ.

අනන්‍ය වූ හඳුනාගැනීමේ අංකයක් හෝ විකල්ප හඳුනාගැනීමේ අංකයක් සටහන් කිරීමට අපොහොසත්වීම, ඔබ විසින් මුදල් තැන්පත් කරන ලද බලපත්‍රලාභී බැංකුවක හෝ බලපත්‍රලාභී මුදල් සමාගමක බලපත්‍රය අවලංගු කළ අවස්ථාවක දී, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ ඔබට හිමි රක්ෂණ වන්දි මුදල් ලබා ගැනීම ප්‍රමාදවීම, අපහසුවීම හෝ නොහැකිවීමට පවා හේතු විය හැකි බව අවධාරණය කරනු ලැබේ.

බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම්වල තැන්පත් ගිණුම් විවෘත කිරීමේ දී හෝ පවත්වාගෙන යාමේ දී තැන්පත්කරුවන් පහත සඳහන් අනිවාර්ය කරන ලද අනන්‍ය හඳුනාගැනීමේ අංක භාවිතා කළ යුතු වේ.

| | **තැන්පත්කරුගේ ස්වභාවය** | **ඉදිරිපත් කළ යුතු හඳුනාගැනීමේ ලේඛනය / අංකය** |
|---|---|---|
| **1.** | **තනි පුද්ගලයන්** | |
| 1.1 | ශ්‍රී ලාංකික පුරවැසියන් | ජාතික හැඳුනුම්පත සහ ජාතික හැඳුනුම්පත් අංකය<br>*විකල්ප ලියකියවිලි*<br>*තැන්පත්කරුවන් තැන්පතු ගිණුම් ආරම්භ කරන අවස්ථාවල දී බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම්වලට ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත්, තැන්පත්කරුගේ රියදුරු බලපත්‍රය හෝ විදේශ ගමන් බලපත්‍රය භාර ගැනීමට අවසර ලබා දී ඇති නමුත්, එහි සඳහන් වන ජාතික හැඳුනුම්පත් අංකය, එම ආයතනවල පරිගණක පද්ධතිවල අනන්‍ය හඳුනාගැනීමේ අංකය වශයෙන් සටහන් කිරීම අනිවාර්ය වේ.* |
| 1.2 | ශ්‍රී ලාංකික පුරවැසියන් (ශ්‍රී ලංකාවෙන් පිටත ජීවත් වන/ නිත්‍ය නේවාසික/ තාවකාලික නේවාසිකත්වය දරන්නන්),<br>ශ්‍රී ලාංකික ද්විත්ව පුරවැසියන් (ශ්‍රී ලංකාවේ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත ජීවත් වන) | ජාතික හැඳුනුම්පත සහ ජාතික හැඳුනුම්පත් අංකය<br>*ව්‍යතිරේක තත්වයන්*<br>*ජාතික හැඳුනුම්පත නොමැති, පහත සඳහන් අවස්ථාවල දී පමණක් ශ්‍රී ලංකා විදේශ ගමන් බලපත්‍ර අංකය භාවිතා කළ හැකිය:*<br>*(අ) තැන්පත්කරුවෙකු විසින් ජාතික හැඳුනුම්පත තාවකාලිකව ආපසු භාර දී ඇති විටක දී.*<br>*(ආ) ශ්‍රී ලාංකිකයෙක් විදේශගතව සිටින විටක දී.*<br>*(ඇ) වයෝපූර්ණත්වයට පෙර ශ්‍රී ලංකාවෙන් පිටව යාම හේතුවෙන්, ජාතික හැඳුනුම්පතක් නොමැති වීම.*<br>*එවැනි අවස්ථාවන්හි දී හැකි ඉක්මනින්ම තම ජාතික හැඳුනුම්පත ලබා ගන්නා ලෙසත් එහි අංකය, බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම්වල පරිගණක පද්ධතිවල යාවත්කාලීන කරන ලෙසත් තැන්පත්කරුවන් වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.* |
| 1.3 | ශ්‍රී ලාංකික නොවන පුරවැසියන්<br>*මේ සදහා ශ්‍රී ලාංකික සම්භවයක් සහිත විදේශීය ජාතිකයන් (ශ්‍රී ලංකාවෙන් පිටත ජීවත් වන), ශ්‍රී ලංකාවේ තාවකාලික සංචාරයේ නියුතු හෝ ශ්‍රී ලංකාවේ සංචාරය කිරීමට අදහස් කරන විදේශීය ජාතිකයන් සහ විදේශීය රාජ්‍යතාන්ත්‍රිකයන් ඇතුළත් වේ.* | විදේශ ගමන් බලපත්‍රය සහ විදේශ ගමන් බලපත්‍ර අංකය |
| 1.4 | බාලවයස්කාර තැන්පත්කරුවන් (ජාතික හැඳුනුම්පත ලබා ගන්නා තෙක්) | උප්පැන්න සහතිකය: *පිළිවෙලින් උපන් දිනය සහ උප්පැන්න සහතිකපත් අංකය, ජාතික හැඳුනුම්පත ලබා ගන්නා තෙක් හඳුනාගැනීමේ අංකය ලෙස සටහන් කිරීම සඳහා අවශ්‍ය වේ.* |
| **2.** | **ආයතන** | |
| 2.1 | සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද සමාගම් | සමාගම් ලියාපදිංචි සහතිකය සහ සමාගම් ලියාපදිංචි අංකය |
| 2.2 | රාජ්‍ය නොවන සංවිධාන | රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය විසින් නිකුත් කරන ලද ලියාපදිංචි සහතිකය සහ අදාළ ලියාපදිංචි අංකය |
| 2.3 | ප්‍රාදේශීය/ පළාත් පාලන ආයතන යටතේ ලියාපදිංචි තනි පුද්ගල ව්‍යාපාර/ හවුල් ව්‍යාපාර/බද්ධ ව්‍යාපාර යනාදී ආයතන | ව්‍යාපාර ලියාපදිංචි සහතිකය සහ ව්‍යාපාර ලියාපදිංචි අංකය |
| 2.4 | පාර්ලිමේන්තු පනතක් මගින් සංස්ථාපනය කරන ලද ආයතනයක් | ආයතනයේ ආරම්භක පාර්ලිමේන්තු පනතේ පිටපතක්: *පිළිවෙලින් ආරම්භක පනත් අංකය සහ සංස්ථාපනය කරන ලද වර්ෂය සටහන් කිරීම සඳහා අවශ්‍ය වේ.* |
| 2.5 | සමිති, සමාජ, සංගම් යනාදී අනෙකුත් සියලු ආයතන | අදාළ බලධාරීන් විසින් නිකුත් කරන ලද ලියාපදිංචි සහතිකය සහ අදාළ ලියාපදිංචි අංකය<br>*ලියාපදිංචි නොකළ ආයතන සඳහා විකල්පයක් ලෙස*<br>*බලපත්‍රලාභී බැංකුවක්, ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය (ITRS) මගින් ලබාගත් හඳුනාගැනීමේ අංකය එම ආයතනය සඳහා අනන්‍ය වූ හඳුනාගැනීමේ අංකය ලෙස සටහන් කිරීමට අවසර ලබා දී ඇත.* |

**අධ්‍යක්ෂ, තැන්පතු රක්ෂණ හා නිරාකරණ දෙපාර්තමේන්තුව,**
ශ්‍රී ලංකා මහ බැංකුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01.
දුරකථන: 0112477261 විද්‍යුත් තැපෑල: ddir@cbsl.lk